// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2321/70 - 2023 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2023.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1992 අංක 4 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත**

1992 අංක 4 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත 6 (1) වැනි වගන්තිය යටතේ 1995 ජනවාරි මස 17 වැනි අඟහරුවාදා අංක 854/6 සහ 2015 පෙබරවාරි මස 10 වැනි අඟහරුවාදා අංක 1901/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව නමින් පිළියෙල කරන ලද නීති මාලාව සභාවේ අණ පරිදි අවලංගු කරන අතර ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව නමින් පිළියෙල කරන ලද නව නීති මාලාව මෙසේ පනවනු ලැබේ.

සභාවේ අණ පරිදි,

ආචාර්ය රෝස් සෝලංගආරච්චි,
ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සභාපති.

2023 ජනවාරි මස 25 වැනි දින,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව පනතේ 6 (1) වැනි වගන්තියේ ප්‍රකාර සම්පාදිත නව ව්‍යවස්ථාවලිය**

01. (අ) **අධි සාමාජිකයෙකු** වශයෙන් සභාවට ඇතුළත් කරගැනීමේ දී දස වර්ෂාධික කාලයක් තුළ සභාවේ සාමාජික කාණ්ඩයේ, අඛණ්ඩව සහ සක්‍රියව සාමාජිකත්වය දරා තිබීම[1].

සහ

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක සභාව මගින් නිකුත් කරනු ලබන "ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ අධි සාමාජිකත්වය සඳහා ස්වයං ඇගයුම් වාර්තාව (Self-assessment Report for the Fellow Membership) සහ සාමාජිකත්ව අයදුම්පත"(Membership Application) නිසි පරිදි සම්පූර්ණකර උක්ත සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

ඉහත සුදුසුකම් සපුරා ඇති යම් තැනැත්තෙකු පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන කමිටුවක් (BARE)[II] මගින් ඇගයීමෙන් පසු සභාවේ **අධි සාමාජිකයෙකු**_වශයෙන් නිර්දේශ කරනු ඇත. තත් නිර්දේශ ප්‍රකාරව පාලක සභාව විසින් අධි සාමාජිකත්වය පිරිනැමීම සිදු කරනු ලැබේ.

(ආ) **සාමාජික කාණ්ඩයේ සාමාජිකයෙකු** වශයෙන් සභාවට ඇතුළත් කරගැනීමේ දී දෙවසරක කාලයක් තුළ සභාවේ සහාය සාමාජික කාණ්ඩයේ, අඛණ්ඩව සහ සක්‍රියව සාමාජිකත්වය දරා තිබීම[I].

**සහ**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් සමග ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක පුරාවිද්‍යාව පිළිබඳ දැ අවුරුදු පශ්චාත් උපාධියක් [III] (ශාස්ත්‍රපති (MA) විද්‍යාපති (MSc) හෝ වෙනත් ඉහළ උපාධියක්)

**හෝ**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ සාමාන්‍ය උපාධියක් සමග ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් සහ දැ අවුරුදු පශ්චාත් උපාධියක්[III] (ශාස්ත්‍රපති (MA) විද්‍යාපති (MSc) හෝ වෙනත් ඉහළ උපාධියක්)

**සහ**

අධි සාමාජිකයෙකුගේ අධික්ෂණය යටතේ පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක වෘත්තීය පුරාවිද්‍යාඥයකු[IV] වශයෙන් දෙවසරක පළපුරුද්දක් ලබා තිබීම. එම පළපුරුද්ද ලබා ඇති බව සනාථ කිරීම සඳහා, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ වෘත්තීය ඇගයීම් වාර්තාව (පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇති පුරාවිද්‍යාඥයන්ගේ ප්‍රගතිය සමාලෝචනය සඳහා වූ කාර්යය සාධන වාර්තාව/ Record Book for Archaeologists) සහ සාමාජිකත්ව අයදුම්පත"(Membership Application) නිසි පරිදි සම්පූර්ණ කර උක්ත සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඉහත සුදුසුකම් සපුරා ඇති යම් තැනැත්තෙකු සාමාජිකත්ව අනු කමිටුව විසින් ඇගයීමෙන් පසු සභාවේ **සාමාජික කාණ්ඩයේ සාමාජිකයෙකු** වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

(ඇ) **සහාය සාමාජිකයෙකු** වශයෙන් සභාවට ඇතුළත් කරගැනීමේ දී පස් වසරක කාලයක් තුළ සභාවේ ලියාපදිංචි කාණ්ඩයේ, අඛණ්ඩව සහ සක්‍රිය ව සාමාජිකත්වය දරා තිබීම [I].

**සහ**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක්

**හෝ**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් සමග ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක්

**සහ**

අධි සාමාජිකයෙකුගේ/ සාමාජික කාණ්ඩයේ සාමාජිකයෙකුගේ අධීක්ෂණය යටතේ සුදුසු රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක වෘත්තීය පුරාවිද්‍යාඥයකු වශයෙන් දෙවසරක පළපුරුද්දක් ලබා තිබීම. එම පළපුරුද්ද ලබා ඇති බව සනාථ කිරීම සඳහා, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ වෘත්තීය ඇගයීම් වාර්තාව (පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇති පුරාවිද්‍යාඥයන්ගේ ප්‍රගතිය සමාලෝචනය සඳහා වූ කාර්යය සාධන වාර්තාව / Record Book for Archaeologists) සහ සාමාජිකත්ව අයදුම්පත" (Membership Application) නිසි පරිදි සම්පූර්ණ කර උක්ත සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඉහත සුදුසුකම් සපුරා ඇති යම් තැනැත්තෙකු සාමාජිකත්ව අනු කමිටුව විසින් ඇගයීමෙන් පසු සභාවේ **සහාය සාමාජික කාණ්ඩයේ සාමාජිකයෙකු** වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

(ඈ) **ලියාපදිංචි සාමාජිකයෙකු** වශයෙන් සභාවට ඇතුළත් කරගැනීමේ දී පස් වසරක කාලයක් තුළ සභාවේ ශිෂ්‍ය කාණ්ඩයේ, අඛණ්ඩව සහ සක්‍රිය ව සාමාජිකත්වය දරා තිබීම[1].

සහ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් තිබීම

හෝ

පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් අනුමත කරනු ලබන දෙවන හා තෙවන පරීක්ෂණයන්ගෙන් සමත්වීම.

හෝ

ඉහත පරීක්ෂණය ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් සම්පූර්ණ කර තිබීම හා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ අවම වශයෙන් පාඨමාලා ඒකක දෙකක් වත් සමත් වී තිබීම ද ලියාපදිංචි සාමාජිකත්වය සඳහා ඇතුළත් වීමේ සුදුසුකමක් ලෙස සැලකේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ලියාපදිංචි සාමාජිකත්වය අපේක්ෂා කරන අයදුම්කරුවෙක් තම සාමාජිකත්ව අයදුම්පත" (Membership Application) නිසි පරිදි සම්පූර්ණ කර උක්ත සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර සාමාජිකත්ව අනු කමිටුව විසින් එය ඇගයීමෙන් පසු සභාවේ **ලියාපදිංචි සාමාජික කාණ්ඩයේ සාමාජිකයෙකු** වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

(ඉ) **ශිෂ්‍ය සාමාජිකයෙකු** වශයෙන් සභාවට ඇතුළත් කරගැනීමේ දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් තිබීම

හෝ

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධි පාඨමාලාවකට ඇතුළත් වී එහි පළමු අධ්‍යයන වර්ෂය සාර්ථකව සම්පූර්ණ කර තිබීම. (එය සනාථ කිරීම සඳහා අධ්‍යයන අංශ ප්‍රධානියාගේ නිර්දේශය ඉදිරිපත් කළ යුතුය).

හෝ

පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් අනුමත කරනු ලබන පළමු පරීක්ෂණයෙන් (පළමු අදියර) සමත්වීම.

හෝ

ඉහත පරීක්ෂණය ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුරාවිද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් සම්පූර්ණ කර තිබීම ද ශිෂ්‍ය සාමාජිකත්වය සඳහා ඇතුළත් වීමේ සුදුසු කමක් ලෙස සැලකේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍ය සාමාජිකත්වය අපේක්ෂා කරන අයදුම්කරුවෙක් තම සාමාජිකත්ව අයදුම්පත" (Membership Application) නිසි පරිදි සම්පූර්ණ කර උක්ත සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර සාමාජිකත්ව අනු කමිටුව විසින් එය ඇගයීමෙන් පසු සභාවේ **ශිෂ්‍ය සාමාජික කාණ්ඩයේ සාමාජිකයෙකු** වශයෙන් ඇතුළත් කර ගනු ඇත.

(ඊ) ඉහත කවරාකාර වුව සාමාජික කාණ්ඩයකට ඇතුළත් වීමට සුදුසුකම් ලබා තිබුණ ද, නව සාමාජිකයකු වශයෙන් පුරාවිද්‍යාඥයන්ගේ සභාවට ඇතුළත් වීමේ දී සංස්ථාගත නොවන සාමාජික කාණ්ඩයේ (ශිෂ්‍ය, ලියාපදිංචි) සිට සංස්ථාගත සාමාජික කාණ්ඩය (ආශ්‍රිත, සාමාජික, අධි සාමාජික) දක්වා ඉදිරියට පිළිවෙළින්, කාණ්ඩයන්හි ආගත පටිපාටිය අනුගමනය කළ යුතුය. (අතරමැදි සාමාජික කාණ්ඩයකට ඇතුළත් විය නොහැකිය).

02. (අ) සභාවේ සංස්ථාගත නොවන කාණ්ඩ නියෝජනය කරන ලියාපදිංචි සාමාජික හා ශිෂ්‍ය සාමාජිකයන්හට තම නියෝජනයන් සඳහා ඡන්ද අයිතිය හිමිවේ.

(ආ) සභාවට හෝ වෘත්තියට අගනා සේවාවක් සලසා ඇති තැනැත්තෙකු මණ්ඩලය විසින් ගරු සාමාජිකයෙකු වශයෙන් සභාවට ඇතුළත් කර ගත හැකි ය. එසේවුවද වුවත් එක් වර්ෂයක දී ගරු සාමාජිකයන් එක් අයෙකුට වඩා සභාව විසින් ඇතුළත් කර නොගත යුතු අතර, ගරු සාමාජිකයන්ගේ මුළු ගණන කවර අවස්ථාවක දී වත් දහ දෙනෙකු නොඉක්මවිය යුතු ය. එසේ ම ඔවුනට සභාව විසින් පවත්වනු ලබන කිසිදු ඡන්දයක දී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමි නොවේ.

03. (අ) කවර කාණ්ඩයක හෝ සාමාජිකත්වයකට ඇතුළත් කර ගැනීම සඳහා වූ සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක්, සක්‍රිය සංස්ථාගත සාමාජිකයන් තිදෙනෙකුගේ අත්සන් සහිතව ඉදිරිපත් කළ යුතු ය. අධි සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සඳහා වූ අයදුම්පතක් නම් එම අයදුම්පත ඉදිරිපත් කළ යුත්තේ සක්‍රිය අධි සාමාජිකයන් දෙදෙනෙකුගේ අත්සනින් යුතුව ය.

(ආ) පාලක මණ්ඩලය මගින් සාමාජික ලේඛනයක් පවත්වා ගෙන යනු ඇත.

(ඇ) සාමාජිකත්වය වෙනුවෙන් හැඳුනුම්පතක් නිකුත් කිරීමට සභාවට බලය ඇත්තේ ය.

(ඈ) සභාවෙහි සාමාජිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීමටත් අරමුදල් රැස් කිරීමටත් බලය සභාවට ඇත්තේ ය.

04. සභාව විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට හා සැලැස්මට අනුව පිළියෙල කළ සාමාජිකත්ව සහතිකයක් මණ්ඩලය විසින් සෑම සාමාජිකයකු වෙතම සභාවේ නිළ මුද්‍රාව සහිතව නිකුත් කරනු ඇත. එම සහතිකය සභාව සතු දේපළක්ව පැවතිය යුතු අතර සාමාජිකයාගේ අභාවය හැර අන් හේතුවකින් ඔහු /ඇයගේ සාමාජිකත්වය අවසන් වී දින හතක් ඇතුළත එය සභාව වෙත ආපසු භාර දිය යුතු ය. යම් හෙයකින් සහතිකයේ මුල් පිටපත අස්ථානගත වීමක දී අනු පිටපතක් නිකුත් කිරීමේ බලය ද මණ්ඩලය සතු ය.

05. යම් තැනැත්තෙකු තමාගේ සියලු හිඟ සාමාජික මුදල් හා ගාස්තු ගෙවීමෙන් ඉක්බිති තම සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමේ අභිමතය සභාවේ ගරු සම ලේකම් වෙත ලිඛිතව දැනුම්දීමෙන් පසුව ඔහුගේ සාමාජිකත්වය අහෝසි වනු ඇත.

06. ඉල්ලා අස්වීමෙන් සාමාජිකත්වය අවසන් වූ තැනැත්තකු නැවතත් සාමාජිකත්වය ඉල්ලා සිටි අවස්ථාවක දී තමා සාමාජිකත්වයෙන් ඉවත් වන අවස්ථාවේ දී දැරූ සාමාජිකත්ව කාණ්ඩයටම අයත් නව සාමාජිකයෙකු වශයෙන් නැවත බඳවා ගැනීමට සභාවට බලය ඇත.

07. (අ) ඇතුළත්වීමේ ගාස්තු, වාර්ෂික සාමාජික මුදල් හා අනෙකුත් ගාස්තු ප්‍රමාණ මෙම ව්‍යවස්ථාවලියේ **උපලේඛනය i** හි පරිදි වනු ඇත.

(ආ) ගරු සාමාජික කාණ්ඩයේ සාමාජිකයන් හැර කුමන හෝ වර්ගයක සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන තැනැත්තෙකු ඇතුළත් කර ගනු ලැබූ දින සිට දෙමසක් ඇතුළත එම වර්ෂය සඳහා වූ තම ඇතුළත් වීමේ ගාස්තුව හා වාර්ෂික සාමාජික මුදල ගෙවිය යුතු ය.

(ඇ) සෑම සාමාජිකයෙකු විසින්ම ගෙවිය යුතු වාර්ෂික සාමාජික මුදල හා වාර්ෂික ගාස්තුවක් ඇතොත් එය පවත්නා වර්ෂය ආරම්භයේ දී ගෙවිය යුතු ය. වර්ෂයේ මාර්තු මස පළමු වැනි දින වන විට එය නොගෙවා ඇත්නම් ගරු භාණ්ඩාගාරික විසින් එම සාමාජිකයා වෙත සිහිකැඳවීමේ ලිපියක් එවනු ඇත. පවත්නා වර්ෂයේ ජුනි මස පළමු වැනි දින වන විට එම මුදල ගෙවීම සිදුකර නොමැති නම් ගරු භාණ්ඩාගාරික විසින් එම සාමාජිකයා වෙත ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් එවනු ඇත. එම දැන්වීම ලැබී මාසයක් ඇතුළත යමකු හිඟ සාමාජික මුදල් ගෙවීම පැහැර හැර ඇත්නම් ඔහු /ඇයගේ සාමාජිකත්වය අවසන් වේ. එසේ නොගෙවා හැරීමට සාධාරණ හේතු තිබූ බව මණ්ඩලයට ඒත්තු ගියහොත් එකී තැනැත්තා සාමාජිකයෙකු වශයෙන් නැවත ඇතුළත් කර ගනු ඇත.

(ඈ) යම් සාමාජිකයෙකුගේ වෘද්ධභාවය, රෝගී බව, බැරිකම හෝ වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා හෝ ස්වකීය වෘත්තියෙහි නිරතවීමට හෝ යම් ලාභදායි දිවිපෙවෙතක යෙදීමට/ ලාභ ඉපයීමට හෝ සමත් නොවේ නම් මණ්ඩලය විසින් යෝජනාවක් සම්මත කිරීමෙන් අනතුරුව එම සාමාජිකයාගේ සාමාජික මුදල සම්පූර්ණයෙන්ම/ පූර්ණ වශයෙන්ම හෝ කොටස් මාත්‍රයකින් හෝ අත්හැර දැමිය හැකි ය.

(ඉ) ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සියලු කාණ්ඩයන්ට අයත් සාමාජික සාමාජිකාවන් වයස අවුරුදු 60 සීමාව ඉක්ම වූ පසු වාර්ෂික සාමාජික මුදලින් අඩක් ගෙවීම ප්‍රමාණවත් වේ.

08. (අ) සභාවේ නිලධාරී මණ්ඩලය (පාලක මණ්ඩලය) පහත සඳහන් පරිදි වේ:
i. ගරු සභාපති
ii. ගරු ආසන්නතම පූර්ව සභාපති
iii. ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
iv. ගරු උප සභාපති
v. ගරු සම ලේකම්වරු දෙදෙනා (2)
vi. ගරු භාණ්ඩාගාරික
vii. ගරු උප භාණ්ඩාගාරික

(ආ) සභාවේ කාරක සභාව කාරක සභිකයන් එකොළොස් (11) දෙනෙකුගෙන් සමන්විත වේ.
පාලක මණ්ඩලය යථෝක්ත නිලධාරී මණ්ඩලයෙන් හා කාරක සභිකයන්ගෙන් සමන්විත වේ.

(ඇ) ගරු සභාපති, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති සහ ගරු උප සභාපති තනතුරුවලට අධි සාමාජික කාණ්ඩයේ සාමාජිකයන් පමණක් සුදුසුකම් ලබනු ඇත. එහෙත් යටත් පිරිසයින් එක් ධුර කාලයක් මණ්ඩලයට අයත් ව සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු පමණක් ගරු උප සභාපති වශයෙන් තෝරා පත් කර ගැනීමට සුදුසුකම් ලබනු ඇත.

(ඈ) ගරු සභාපති විය යුත්තේ ඉකුත් වර්ෂය අවසාන වන විට ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති ධූරය දැරූ තැනැත්තා ය. එවැනි සාමාජිකයෙකු එක් ධුර කාලයකට වඩා සභාපති ධූරය දැරිය යුතු නොවන නමුත් මණ්ඩල ධුර කාල දෙකක් ඉකුත් වූ පසු ඔහු එම ධූරයටම නැවත තෝරා පත් කර ගත හැකි ය.

(ඉ) යටත් පිරිසයින් එක් ධුර කාලයක් මණ්ඩලයට අයත්ව සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු පමණක් ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති වශයෙන් තෝරාපත් කර ගැනීමට සුදුසුකම් ලබනු ඇත. එවැනි සාමාජිකයෙකු පිට පිට එක් ධුර කාලයකට වඩා ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති ධුරය නොදැරිය යුතු නමුත් එක් මණ්ඩල ධුර කාලයක් ඉකුත් වූ පසු එම ධුරයට ම ඔහු නැවත තෝරා පත් කරගත හැකි ය.

(ඊ) යටත් පිරිසයින් එක් ධුර කාලයක්වත් මණ්ඩලයට අයත්ව සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු පමණක් ගරු උප සභාපති වශයෙන් තෝරාපත් කර ගැනීමට සුදුසුකම් ලැබෙනු ඇත. එවැනි සාමාජිකයෙකු එක් ධුර කාලයකට වඩා ගරු උප සභාපති ධූරය දැරිය යුතු නොවන නමුත් ධුර කාල අවසන් වී එක් මණ්ඩල ධුර කාලයක් ඉකුත් වූ පසු එම ධූරයටම ඔහු නැවත තෝරා පත් කර ගත හැකි ය.

(උ) ගරු ආසන්නතම පූර්ව සභාපති ඉකුත් ධුර කාලය අවසානයේ දී සභාපති ධුරය දැරූ තැනැත්තා ය.

(ඌ) යටත් පිරිසයින් එක් ධුර කාලයක්වත් මණ්ඩලයට අයත්ව සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයකු පමණක් ගරු සම ලේකම්, ගරු භාණ්ඩාගාරික හෝ ගරු උප භාණ්ඩාගාරික වශයෙන් තෝරා පත් කර ගැනීමට සුදුසුකම් ලබනු ඇත. එවැනි සාමාජිකයෙකු එක් ධුර කාලයකට වඩා දැරූ තනතුරක් නොදැරිය යුතු නමුත් එක් මණ්ඩල ධුර කාලයක් ඉකුත් වූ පසු නැවතත් තෝරාපත් කර ගත හැකි ය.

(එ) පාලක මණ්ඩලයේ ගරු සභාපති, ගරු ආසන්නතම පූර්ව සභාපති, ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති, ගරු උප සභාපති, ගරු සම ලේකම්වරු, ගරු භාණ්ඩාගාරික හා ගරු උප භාණ්ඩාගාරික තනතුරුවලට පත්වන සාමාජිකයන් හට අඛණ්ඩව ධුර කාල දෙකක් තමන් පත්වූ තනතුර ඡන්ද විමසීමකින් තොරව දැරිය හැකි ය.

(ඒ) පාලක මණ්ඩලයේ එක් ධුර කාලයක් යනුවෙන් අදහස් වන්නේ වාර්ෂික මහා සභා රැස්වීම් දෙකක් අතර කාලය යි.

09. (අ) අධි සාමාජික කාණ්ඩයේ හෝ සාමාජික කාණ්ඩයේ සාමාජිකයෙකු එක් වසරක කාලයකට පමණක් අධ්‍යයන අනු කමිටුවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා සුදුසුකම් ලබනු ඇත. එවැනි සාමාජිකයෙකු අඛණ්ඩව වසර දෙකක් ධුරය නොදැරිය යුතු වුවත් එක් වසරක් ඇවෑමෙන් නැවතත් තෝරා පත් කරගත හැකි ය.

(ආ) අධ්‍යයන අනු කමිටු සභාපති නිල බලයෙන් පාලක මණ්ඩලයේ සාමාජිකයෙක් වේ.

10. (අ) පාලක මණ්ඩලය, නිලධාරී මඬුල්ල ද ඇතුළුව සාමාජිකයන් දහනවයකට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර එම සාමාජිකයන්ගෙන් එක් අයෙකු අධ්‍යයන මණ්ඩලයේ සභාපති විය යුතු ය.

(ආ) පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුවත් සහාය සාමාජිකයන් විය යුතු අතර තිදෙනෙකුට නොවැඩි ගණනක් සංස්ථාගත නොවූ සාමාජිකයන් විය යුතු ය.

11. (අ) පූර්වෝක්ත නිලධාරීන් හා කාරක සභිකයන් අටදෙනෙකු තෝරාපත් කර ගැනීමේ දී ඡන්දය භාවිත කිරීමට හිමිකම් ලැබිය යුත්තේ සංස්ථාගත සාමාජිකයන්ට පමණකි.

(ආ) සංස්ථාගත සාමාජිකයෙක් ඉහත 11.(අ) හි දැක්වෙන තනතුරු සඳහා යම් සංස්ථාගත සාමාජිකයෙකු පාලක මණ්ඩල සභිකයකු ලෙස බැඳී සේවය කිරීමට නාම යෝජනා ඉදිරිපත් කිරීමේ දී, එම යෝජනා කිරීම හෝ ස්ථිර කිරීම උපරිමය අපේක්ෂකයන් දෙදෙනෙකුට පමණක් සීමා කළ යුතු ය.

12. (අ) ලියාපදිංචි සාමාජිකයන්ට හා ශිෂ්‍ය සාමාජිකයන්ට පාලක මණ්ඩලයේ දී තමන් නියෝජනය කිරීම සඳහා පිළිවෙලින්, අවම වශයෙන් එක් ලියාපදිංචි සාමාජිකයෙකු හා එක් ශිෂ්‍ය සාමාජිකයෙකු තෝරාපත් කර ගැනීමට හිමිකම් තිබිය යුතු ය.

(ආ) එකී සාමාජිකයන්ට පාලක මණ්ඩලයේ රැස්වීම් වාර දන්වනු ලැබීමට හා ඊට සහභාගීවීමට ද හිමිකම් තිබිය යුතු නමුත් එහි දී සංස්ථාගත ධුර සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොතිබි ය යුතු යි. ඔවුන් කිසිම විනයානුකූල පරීක්ෂණයක දී හෝ ඊට අදාළ යම් කරුණක් පිළිබඳ සාකච්ඡාවක දී හෝ සම්මුඛයෙහි නොසිටිය යුතු ය. ඊට සහභාගිවීමට ද නොහැකි ය.

13. පාලක මණ්ඩලයේ සාමාජිකයකුගේ සභාවේ සාමාජිකත්වය අවසන් වුවහොත් හෝ ඉදින් ඔහු ගරු සභාපති නමට හෝ ගරු ලේකම් නමට හෝ ලියූ ලිපියකින් ස්වකීය ධූරයෙහි ඉල්ලා අස්වීමට තමාගේ කැමැත්ත දන්වා සිටියහොත් එවිට එම සාමාජිකයාගේ ධුර කාලය අවසන් වන්නේ ය.

14. (අ) ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති, ගරු සභාපති, ගරු සම ලේකම්, හෝ ගරු භාණ්ඩාගාරික යන යම් අයෙකු අභාවප්‍රාප්ත වූ විටක දී හෝ ධූරය හැර ගිය විටක දී හෝ ඊළගට පත්වන පාලක මණ්ඩලය නිලතල භාර ගන්නා තෙක් අදාළ පරිදි ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති හෝ ගරු උප සභාපති හෝ ගරු සම ලේකම් හෝ ගරු උප භාණ්ඩාගාරික විසින් එකී පුරප්පාඩුව පිරවිය යුතු ය.

(ආ) පාලක මණ්ඩලයේ සාමාජිකයකු අභාවප්‍රාප්ත වූ විටක දී හෝ තනතුර හැර ගිය විටක දී 14(අ) වැනි වගන්තිය ක්‍රියාත්මක වීමෙන් හෝ වෙනත් හේතුවකින් හෝ පුරප්පාඩුවක් ඇති වූ විට මණ්ඩලය විසින් එකී ධූරයට සාමාජිකයෙකු පත් කළ යුතුයි.

15. (අ) පාලක මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට වරක්වත් රැස්විය යුතු අතර මණ්ඩලයේ ඊළග රැස්වීම පැවැත්වෙන දිනය හැකිතාක් දුරට මණ්ඩලයේ එක් එක් රැස්වීම් වාරයක දී ම නියමකර ගත යුතු ය.

(ආ) සභාපති නියම කළහොත් හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයන් හය දෙනෙකුවත් අත්සන් කළ ලිඛිත ඉල්ලීමක් ලත් විට හෝ සභාපති විසින් නිශ්චිතව දන්වා ඇති නැතහොත් ලිඛිත ඉල්ලීමේ නිශ්චිත ව දක්වා ඇති යම් කරුණක් සළකා බැලීම සඳහා මණ්ඩලයේ විශේෂ රැස්වීමක් ගරු ලේකම් විසින් කැඳවිය යුතු ය. එවැනි රැස්වීමක් පැවැත්වෙන දිනය වේලාව සහ ස්ථානය ද රැස්වීමේ දී කරන්නට යන කටයුතු ද මණ්ඩලයේ සියලු සාමාජිකයන් හට යටත් පිරිසයින් පැය 48 කට වත් පූර්වයෙන් දැනුම්දිය යුතුය.

(ඇ) පාලක මණ්ඩලයේ රැස්වීමක් සඳහා සන පූර්ණය (සංස්ථාගත නොවූ සාමාජිකයන් හැර) සාමාජිකයන් හයදෙනෙකු විය යුතු ය.

(ඈ) පාලක මණ්ඩලයේ රැස්වීම් සඳහා පැහැදිලි හේතුවකින් තොරව නොදන්වා අඛණ්ඩව වාර තුනක් සහභාගි නොවන සාමාජිකයන් මණ්ඩලයෙන් ඉවත් කළ යුතු අතර එවැනි සාමාජිකයන්හට වසර 4 ක් ඉකුත් වන තෙක් මණ්ඩලයේ තනතුරු සඳහා ඉදිරිපත් විය නොහැක.

(ඉ) පුරාවිද්‍යාඥයන්ගේ සභාව පනතෙහි අංක 10 වගන්තිය ප්‍රකාරව පාලක මණ්ඩලයේ අභිමතය පරිදි සභාවේ පරිපාලනමය කටයුතු පහසු කර ගැනීම සඳහා පාලක ලේකම්වරයෙකු පත් කර ගැනීමේ බලය පාලක මණ්ඩලය සතු වේ.

16. (අ) පාලක මණ්ඩලයේ/සභාවේ සභාපති ධුරය සහ ආසන්නතම පූර්ව සභාපති ධුරය හැර වෙනත් කවර හෝ ධුරයක් සඳහා තෝරාපත් කර ගැනීමට සුදුසුකම් ඇති කවර හෝ සංස්ථාගත සාමාජිකයෙකු තෝරාපත් කර ගැනීමට ඕනෑම සංස්ථාගත සාමාජිකයන් දෙදෙනෙකු විසින් නාම යෝජනා ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඕනෑම ලියාපදිංචි සාමාජිකයන් දෙදෙනෙකු විසින් හා ඕනෑම ශිෂ්‍ය සාමාජිකයන් දෙදෙනෙකු විසින් පිළිවෙලින් කවර හෝ ලියාපදිංචි සහ කවර හෝ ශිෂ්‍ය සාමාජිකයෙකු 12(අ) වැනි වගන්තියේ ප්‍රකාර මණ්ඩලයට තෝරාපත් කර ගනු ලැබීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) එම නාම යෝජනා ලිඛිතව තිබිය යුතු අතර යෝජනාකරු හා ස්ථිරකරු ඊට අත්සන් තබා තිබිය යුතු අතර වාර්ෂික සාමාජික ගාස්තු හා වෙනත් ගෙවීම් වෙතොත් එම සියළු ම මුදල් ගෙවා ඇති බව තහවුරු කළ යුතු ය. තව ද අදාළ ව්‍යවස්ථා අනුව තෝරාපත් කරගනු ලැබීම සඳහා තමාට සුදුසුකම් ඇති බවටත් තෝරාපත් කරගනු ලැබුවහොත් පාලක මණ්ඩලයට අයත්ව සේවය කිරීමට තමා කැමැත්ත ප්‍රකාශ කරන බවටත් අපේක්ෂකයා විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

(ඈ) තෝරාපත් කර ගැනීම සඳහා යටත් පිරිසෙයින් වාර්ෂික මහ සභාව පැවැත්වීමට දින 15කට වත් පෙරාතුව එම නාම යෝජනා සාමාජිකයා විසින් ගරු සම ලේකම් වෙත භාර දිය යුතු ය.

(ඉ) පාලක මණ්ඩලය විසින් එහි අවසාන රැස්වීම් වාරයේදී සභාපති හා ආසන්නතම පූර්ව සභාපති ධූරය හැර මණ්ඩලයේ එක් එක් ධූරයක් සඳහා එක් එක් අපේක්ෂකයකු බැගින් යෝජනා ස්ථිරත්වයෙන් නම් කළ හැකි ය. අදාළ ව්‍යවස්ථාව ප්‍රකාර තෝරාපත් කර ගැනීම සඳහා තමාට සුදුසුකම් ඇති බවටත් තෝරාගනු ලැබුවහොත් මණ්ඩලයට අයත්ව සේවය කිරීමට කැමති බවටත් එම අපේක්ෂකයා එසේ නම් කරනු ලැබීමට ඉහතින් හෝ සති දෙකක් ඇතුළත හෝ ප්‍රකාශයක් ලියා අත්සන් කර ඇතොත් මිස එවැනි නාම යෝජනාවක් වලංගු නොවනු ඇත.

17. (අ) වාර්ෂික මහා සභාව පිළිබඳ දැන්වීමට 16 වැනි වගන්ති ප්‍රකාරව නාම යොජනා කරනු ලැබ ඇති සියළු අපේක්ෂකයන්ගේ නාම ලේඛනයක් ද ඇතුළත් විය යුතු ය.

(ආ) පවත්නා ලිත් වර්ෂය වෙනුවෙන් තමාගෙන් අය විය යුතු සාමාජික මුදල් කලින් ගෙවා ඇතොත් මිස කිසිම සාමාජිකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබෙනු ඇත.

(ඇ) නිලධාරී මණ්ඩලය තෝරාපත් කර ගැනීම වාර්ෂික මහා සභාවේ න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රමුඛ කාර්යය විය යුතු ය. ඡන්දය ප්‍රකාශ කළ යුත්තේ රහස් ඡන්ද ක්‍රමයට ය.

(ඈ) ඡන්ද පත්‍රිකා පිළියෙල කිරීම හා නිකුත් කිරීම ඡන්ද පෙට්ටි සැපයීම හා ඡන්ද ගණන් කිරීම ජ්‍යෙෂ්ඨ උප සභාපති සතු වගකීම වන අතර යම් නාම යෝජනා පත්‍රයක වලංගුභාවය යම් අපේක්ෂකයකු ගේ යෝග්‍යතාව ඡන්දය ප්‍රකාශ කිරීමට යම් සාමාජිකයකුට ඇති අයිතිය යන මේ කරුණු සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ තීරණය අවසාන තීරණය විය යුතු ය. ධූර අපේක්ෂකයන් නොවන අධි සාමාජික කාණ්ඩයෙහි සාමාජිකයන් පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් ඔහු /ඇය විසින් තමාට සහය වීම පිණිස පත් කර ගත හැකි ය.

(ඉ) එක් ධූරයකට වැඩි ගණනක් සඳහා එක් අපේක්ෂකයෙකුගේ නම යොජනා කළ හැකි ය. එහෙත් එක් ධූරයකට තෝරාපත් කරනු ලැබුවහොත් වෙනත් ධූරයක් සඳහා ඔහුට දෙන ලද ඡන්ද නොසලකා හැරිය යුතු ය. මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ දී ගරු ජ්‍යෝෂ්ඨ උප සභාපති, උප සභාපති, ගරු සම ලේකම්, ගරු භාණ්ඩාගාරික, ගරු උප භාණ්ඩාගාරික යන අනෙකුත් ධූර සඳහා දෙන ලද ඡන්ද ගණන් කළ යුත්තේ එකී අනුපිළිවෙලට ය.

18. සභාවේ මුදල් වර්ෂය ජනවාරි 01 වැනිදා සිට දෙසැම්බර් 31 වැනිදා දක්වා විය යුතු ය.

19. පාලක මණ්ඩලයේ සාමාජිකයන් තමන් තෝරා පත් කර ගන්නට යෙදුණු වාර්ෂික මහා සභාව පැවැත්වුණු දිනයේ සිට තම අනුප්‍රාප්තිකයන් තෝරාපත් කර ගන්නා වාර්ෂික මහා සභාව පැවැත්වෙන දිනය දක්වා ධූරය දැරිය යුතු ය.

20. (අ) සභාවේ සාමාජිකයන්ගේ වාර්ෂික මහා සභාව සෑම වර්ෂයකම මාර්තු මාසය ඉකුත්වීමට පෙර පැවැත් විය යුතු ය. වාර්ෂික මහා සභාවේ න්‍යාය පත්‍රයට පහත සඳහන් කාර්යයන් ඇතුළත් විය යුතු ය.

(i) පාලක මණ්ඩලයේ නිලධාරීන් සහ කාරක සභා සාමාජිකයන් තෝරාපත් කර ගැනීම.
(ii) ඉකුත් වර්ෂය සඳහා වූ මහා සභා වාර්තාව, වාර්ෂික වාර්තාව සහ විගණනය කළ ගිණුම් ප්‍රකාශය සම්මත කර ගැනීම.
(iii) විධි වූ පරිදි කලින් දැනුම් දී ඇති අනෙකුත් කටයුතු.

(ආ) වාර්ෂික මහා සභාව සහ සෙසු මහා සභා රැස්වීම් පැවැත්වෙන දිනය, වෙලාව සහ ස්ථානය දින දහයකටවත් පෙර සියළු සාමාජිකයන්ට දැනුම් දිය යුතු ය.

(ඇ) වාර්ෂික මහා සභාව මාර්තු මස අවසානයට පෙර නොපැවැත්වුවහොත් වාර්ෂික මහා සභාව කැඳවා එහි සියළු කටයුතු කරගෙන යාමට විධි විධාන සැලසීම වස් මෙහි 21 වැනි වගන්ති ප්‍රකාරව නියම කර ඇති සභාවේ සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතු ය.

(ඈ) වාර්ෂික මහා සභාවට අමතරව සභාවේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම් තුනක්වත් පැවැත්වීමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය.

(ඉ) 20 (ඇ) වගන්තිය ප්‍රකාරව ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් වසංගත රෝග තත්වයක් හෝ වෙනත් ආපදා තත්වයක් කරණ කොටගෙන මෙකී කාලවකවානුවට අනුකූලව වාර්ෂික මහා සභාව පැවැත්වීමට නොහැකි තත්වයක් උද්ගත වුවහොත්, එම කාලසීමාව මඟහැර තත්වය සමනය වූ පසු ඉදිරි වර්ෂයේ නියමිත කාලසීමාව තුළ අදාළ වාර්ෂික මහා සභාව පැවැත්වීමට කටයුතු සැලැස්විය යුතු ය. එසේ නොමැතිනම් සභාවේ රැස්වීම් සම්මුඛව පැවැත්විය නොහැකි අවස්ථාවල දී දුරස්ථ ක්‍රමය මගින් රැස්වීම් පැවැත්විය යුතු ය.

(ඊ) එහෙත් ඊට අදාළ අනුෂාංගික කරුණු යථා පරිද්දෙන් පැවතුණු බව සැලකිය යුතු ය.

එවැනි තත්වයක දී පවතින පාලක මණ්ඩලයේ නිල කාලය අදාළ මහා සභාව පවත්වා පාලක මණ්ඩලය පත්වන තෙක් නිල වශයෙන් පිළිගත යුතු ය. එසේ ම වාර්ෂික සාමාජික මුදල් ගෙවීම ද 20(ඉ) වගන්තිය ක්‍රියාත්මක වීමෙන් අකර්මන්‍ය නොවිය යුතු ය.

21. (අ) ගරු සභාපති නියම කළහොත් හෝ සංස්ථාගත සාමාජිකයින් පහළොස්දෙනෙකුවත් අත්සන් කළ ලිඛිත ඉල්ලීමක් ලද හොත් සාමාජිකයන් විසින් ලිඛිත ඉල්ලීමේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කරුණක් සලකා බැලීම සඳහා සභාවේ සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් ගරු සම ලේකම් විසින් කැඳවිය යුතු ය.

(ආ) එවැනි රැස්වීම් පැවැත්වෙන දිනය, වෙලාව සහ ස්ථානය ද, රැස්වීම් කටයුතුවල ස්වභාවය ද යටත් පිරිසෙයින් දින තුනකටවත් පූර්වයෙන් සියළු සාමාජිකයන්ට දැනුම්දිය යුතු ය.

22. (අ) සභාවේ සාමාජිකයන්ගේ සියළු රැස්වීම්වල දී ගරු සභාපති මුලසුන දැරිය යුතු ය. ඔහු නොපැමිණියේ නම් ආසන්නතම පූර්ව සභාපති, ජ්‍යෙෂ්ඨ උප සභාපති, උප සභාපති හෝ ඔවුන් පැමිණ නැතහොත් පැමිණ සිටින සාමාජිකයින් විසින් පත් කරනු ලබන පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු මුලසුන දැරිය යුතු ය.

(ආ) සභාවේ සාමාජිකයන්ගේ රැස්වීමක් සඳහා සන පූර්ණය සංස්ථාගත සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකි. රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවේ සිට පැය භාගයක් ඇතුළත සන පූර්ණයක් ඇති නොවුනහොත් රැස්වීම කල් තබා, එසේ කල් තබන ලද රැස්වීම සඳහා නියමිත වේලාවේ සිට පැය භාගයක් ඇතුළත සන පූර්ණයක් ඇති නොවුනහොත් පැමිණ සිටින සංඛ්‍යාව සන පූර්ණය විය යුතු ය.

(ඇ) සංස්ථාගත නොවූ සාමාජිකයන් හට සියළු රැස්වීම්වලට පැමිණ සහභාගී වියහැකි නමුත් මෙහි දොළොස්වන වගන්ති ප්‍රකාරව ඔවුන් සඳහා ඡන්ද අයිතිය හිමි වේ.

23. (අ) පාලක මණ්ඩලය විසින් අධ්‍යයන අනු කමිටුවක් පත් කළ යුතු අතරම පාලක මණ්ඩලයේ අරමුණුවලට හෝ මණ්ඩලය සතු කාර්යවලට හෝ සම්මත යම් යම් විශේෂිත කරුණු ගැන උපදෙස් දීමට සහ සහායවීම සඳහා මණ්ඩලය සුදුසු යැයි අදහස් කරන අන්දමට වෙනත් මණ්ඩල, කමිටු හෝ අනු කාරක සභා[V]ද පත් කළ හැකි ය.

(ආ) පනතේ 3(අ), (ආ) සහ (ඉ) යන වගන්තිවල නියම කර ඇති පරිදි ශිෂ්‍යයන් ගේ පුරාවිද්‍යා අධ්‍යාපනය පිළිබඳවත්, විභාග පැවැත්වීම හා ඊට අදාළ සියළු කරුණු පිළිබඳවත් අධ්‍යයන අනු කමිටුව ක්‍රියා කළ යුතු ය. සභාවේ සභාපති නිල බලයෙන් අධ්‍යයන අනු කමිටුවේ සාමාජිකයෙකු විය යුතු ය.

(ඇ) සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමේ විභාගවලට පාඨමාලා පැවැත්වීමත් එම පාඨමාලාවන් සඳහා විභාග පැවැත්වීමත්, අධි සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් කරන්නා වූ ස්වයං ඇගයුම් වාර්තාව පරීක්ෂා කිරීමත් එය අනුමත කිරීමත් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක මණ්ඩලය විසින් පත්කරන ලද පුරාවිද්‍යා අධ්‍යයන මණ්ඩලයට (BARE)[II] පැවරිය යුතු ය.

24. පුරාවිද්‍යාවේ උන්නතිය වැඩි දියුණුව සඳහා ඒ ඒ වර්ෂය තුළ සපුරා ඉටු කරන ලද විශිෂ්ටතම මෙහෙය වෙනුවෙන් සභාව විසින් වාර්ෂිකව රන් පදක්කම් පිරිනැමිය හැකි ය. ඒ සඳහා සභාව මගින් වරින් වර අනුමත කර ගනු ලබන නිර්ණායක අනුගමනය කළ යුතුය (**උපලේඛනය ii**).

25. ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවෙහි සාමාජිකත්වය දරන සාමාජිකයෙකු බාහිර පාර්ශවයක් සඳහා සේවය සැපැයීමේ දී පුරාවිද්‍යා උපදේශන හා සේවා ගාස්තු ලෙස පහත (**උපලේඛන iii**) පරිදි ඉල්ලුම් කළ හැකි ය.

26. (අ) ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ අධි සාමාජික, සාමාජික සහ සහාය සාමාජික කාණ්ඩයන්ට ඇතුළත්වීමේදී පමණක් හිමිවන "පුරාවිද්‍යාඥ" යන අභිධානය පරිහරණය කිරීමේ දී එම තනතුරු නාමයෙහි අභිමානය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට සියළු ම පුරාවිද්‍යාඥයන් බැඳී සිටියි. මේ සඳහා ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් 2019 වර්ෂයේ මාර්තු මස 29 දින මහ සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද පුරාවිද්‍යාඥයන් සඳහා වූ ආචාරධර්ම පද්ධතියට (Code of Conduct) අනුකූලව කටයුතු කළ යුතු ය.

(ආ) ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ අධි සාමාජික, සාමාජික සහ සහාය සාමාජික යන කාණ්ඩයන්ට පමණක් පරිහරණය කිරීමට හිමිකම් සපුරන ''පුරාවිද්‍යාඥ'' යන අභිධානය එම සාමාජික කාණ්ඩයන්ට අයත් තැනැත්තෙකුට මිස වෙනත් කවර හෝ තැනැත්තෙකුට කුමන හෝ අයුරකින් භාවිත කිරීම තහනම් වේ.

(ඇ) 1992 අංක 04 දරන ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන් ගේ සභාව සංස්ථාගත පනත ප්‍රකාරව පිහිටුවාගන්නා ලද එම සභාවේ නාමය භාවිත කරමින් වෙනත් සංගම් ස්ථාපනය කිරීම, ලියාපදිංචිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරාවිද්‍යාඥයන්ගේ සභාව මගින් ඉදිරිපත් කරන ලද මේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් හිමිකම් ඇහිරේ.

## උපලේඛනය i

සාමාජික මුදල් හා ගාස්තු

| සාමාජිකත්වය | ඇතුළත්වීමේ ගාස්තු | වාර්ෂික සාමාජික මුදල |
|---|---|---|
| | රු.ශ | රු.ශ |
| අධි සාමාජික | 2000.00 | 2000.00 |
| සාමාජික | 1250.00 | 1250.00 |
| සහාය සාමාජික | 1000.00 | 1000.00 |
| ලියාපදිංචි සාමාජික | 750.00 | 750.00 |
| ශිෂ්‍ය සාමාජික | 500.00 | 500.00 |

## උපලේඛනය ii

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව මගින් ප්‍රදානය කරනු ලබනු රන් පදක්කම් සඳහා නිර්ණායක**

(ii-1) ශ්‍රී ලාංකිකයෙකු වීම.
(ii-2) ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සාමාජිකයෙකු වීම.
(ii-3) අදාළ ක්ෂේත්‍රය තුළ අද්වීතීය පර්යේෂකයෙකු වීම.
(ii-4) ජාතික මෙහෙවරක නියලෙන්නෙකු වීම හා එකී ශක්‍යතාවන් සමාජගත ව පැවැතීම.
(ii-5) පර්යේෂණ ග්‍රන්ථ, පත්‍රිකා ප්‍රකාශයට පත්කොට තිබීම.
(ii-6) ක්ෂේත්‍රයේ නව දැනුම මෙන් ම ගවේෂණයෙහිලා ප්‍රමුඛයෙකු වීම.
(ii-7) තත් පර්යේෂණයන්, ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයකට මඟපාදන්නක් වීම හා පර්යේෂණයේ බිම් සළකුණු සමාජ භාවිතයට ගෙන තිබීම.
(ii-8) ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු සේම, මනා චරිතවත් අයකු වීම.
(ii-9) ප්‍රායෝගික හා න්‍යායාත්මක අංශ ද්වයෙන් ම විශිෂ්ටයෙකු වීම.
(ii-10) ක්ෂේත්‍රයට අමතර ව සභාවේ සාමාජිකයකු වන වෘත්තිකයෙකු වශයෙන් ඇගයීමට පාත්‍ර ව සිටීම ද තවදුරටත් සුදුසුකමක් ලෙස සැලකේ. (නිදසුන්- කෞතුකාගාර, ගුරු සේවය ආදි වශයෙන් )

(ii-11) ඉහත (ii -1 සිට ii -10) දක්වා ඇති නිර්ණායකන්ට බැහැරව ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ ගරු සභාපති ධූරය හොබවමින් පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ මෙන්ම පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙහි උන්නතිය සඳහා සිදුකරන ලද සේවය වෙනුවෙන් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ ඉකුත් වර්ෂයන්හි ගරු සභාපති ධූරය දැරූ පුරාවිද්‍යාඥයන් සඳහා ද වාර්ෂිකව රන් පදක්කම් පිරිනැමිය හැකි ය.

**පහත සඳහන් ක්‍රියා මාර්ග ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් ඊට අදාළ කර ගත යුතුය.**

( ii - අ) රන් පදක්කම් පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක මණ්ඩලය විසින් කමිටුවක් පත්කර ගැනීම.
( ii - ආ) කමිටුව විසින් අයදුම්පත් කැඳවීම ප්‍රසිද්ධ කළ යුතු ය.
( ii - ඇ) අයදුම්කරුවන් වෙතින් විධිමත් පරිදි නාම යෝජනා කැඳවීම.
( ii - ඈ) සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව මඟින් අයදුම්පත් භාර ගැනීම.
( ii - ඉ) රන් පදක්කම් පිරිනැමීම සඳහා සළකා බැලීමේ කාලය ගෙවුණු වසර 3 ක් විය යුතු අතර, එකී වසර ත්‍රිත්වයේ ඇගයීමෙන් පසු වසරකට පාලක සභාව විසින් ගන්නා තීරණයන්ට අනුව ප්‍රදානයන් සිදුකළ යුතු ය.
( ii- ඊ) පදක්කම් පිරිනැමීමට කමිටු සාමාජිකයන් බහුතරයකගේ එකඟතාව ලබා තිබීම.
( ii- උ) කමිටුව වෙත ලැබෙන සියලු තොරතුරු සුරක්ෂා කර ගැනීම කමිටුවේ වගකීමක් විය යුතු ය.

## උපලේඛනය iii

ඒ ඒ සාමාජිකත්වය දරන සාමාජිකයෙකු බාහිර පාර්ශවයක් සඳහා සේවය සැපැයීමේ දී පුරාවිද්‍යා උපදේශන හා සේවා ගාස්තු ලෙස පහත පරිදි වේ.

| *සාමාජිකත්වය* | *උපදේශන හා සේවා ගාස්තු* |
|---|---|
| | *රු. ශත* |
| අධි සාමාජික | 5000.00 |
| සාමාජික | 4000.00 |
| සහාය සාමාජික | 3000.00 |
| ලියාපදිංචි සාමාජික | 2000.00 |
| ශිෂ්‍ය සාමාජික | 1000.00 |

අර්ථ නිරූපණ :
**I** - **සක්‍රියව සාමාජිකත්වය** දරා තිබීම යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් පවත්වනු ලබන වාර්ෂික මහා සභා සඳහා සහභාගිවීම සහ සෑම සාමාජිකයෙකු විසින් ම ගෙවිය යුතු වාර්ෂික සාමාජික මුදල අඛණ්ඩව ගෙවා තිබීම ය.

**II** - **පුරාවිද්‍යා අධ්‍යයන මණ්ඩලය** (Board of Archaeological Education /BARE) යන්නෙන් අදහස් කරනුයේ සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලැබීමේ විභාගවලට අදළ පාඨමාලාවන් පැවැත්වීමත්, එම පාඨමාලාවන් සඳහා විභාග පැවැත්වීමත්, අධි සාමාජකත්වය ලබා ගැනීමට අයදුම්කරුවන් ඉදිරිපත් කරන්නා වූ ස්වයං ඇගයුම් වාර්තාව පරීක්ෂා කිරීමත්, එය අනුමත කිරීමත් සඳහා ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ අධ්‍යයන මණ්ඩලය යි.

**III** - මෙහිදි **පශ්චාත් උපාධියක්** ලෙස හඳුන්වන්නේ දෑ අවුරුදු ශාස්ත්‍රපති (MA), විද්‍යාපති (MSc) හෝ දර්ශනපති (MPhil) දර්ශනශූරි (PhD) උපාධියක් ය.

**IV** - **වෘත්තීය පුරාවිද්‍යාඥයා** යන්නෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත 13 (1) සහ මෙම නව ව්‍යවස්ථාවලියේ 26 (ආ) වගන්තිය ප්‍රකාරව "පුරාවිද්‍යාඥයා යන අභිධානය දැරීමට, ගැනීමට සහ භාවිත කිරීමට හිමිකම ඇති" (සභාවේ අධි සාමාජික, සාමාජික සහ සහාය සාමාජික කාණ්ඩයන්හි සුදුසුකම් සපුරා ඇති) සාමාජිකයන් ය.

**V** - පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන **අනු කමිටුවක්, මණ්ඩල, හෝ අනු කාරක සභා** යන්නෙන් අදහස් කරනුයේ පාලක මණ්ඩලයේ අරමුණුවලට හෝ මණ්ඩලය සතු කාර්යවලට හෝ සම්මත යම් යම් විශේෂිත කරුණු ගැන උපදෙස් දීම සහ සහායවීම සඳහා පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන්නාවූ කමිටු ය.

EOG 03 - 0024

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.